සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## අවසාන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 09 - 2023

## භූගෝල විද්‍යාව

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.

01. ලෝක ජන සංඛ්‍යාවෙන් අඩකටත් වැඩි ප්‍රමාණයක් ............................................ වාසය කරති.

(ආසියාවේ / අප්‍රිකාවේ / යුරෝපයේ)

02. ආසියාවේ දිග ම ගඟ වන්නේ ........................................... ගඟ ය.

(හොවැංහෝ / යැංසි / ගංගානම්)

03. ඩුබායි යනු එමිරේට්ස් රාජ්‍යයන් ....................................... ට අයත් එක් රාජ්‍යයකි.

(පහ / හය / හත)

04. නිරිතදිග මෝසම, මඩකලපුව ප්‍රදේශයේ දී ....................................... නමින් හඳුන්වයි.

(කොඩයිකාලම් / කච්චාන් / යල්වැසි)

05. චීනය, ජපානය ආදී රටවල ..................................................... මානව වර්ගයට අයත් ජනයා ජීවත් වෙති.

(මොංගොලොයිඩ් / කොකසොයිඩ් / නීග්‍රොයිඩ්)

- අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් ( ✓ ) ලකුණද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06. ශේෂ කඳු අභ්‍යන්තර තැනිතලාවේ පිහිටි ප්‍රධාන භූ ලක්ෂණයකි. (............)

07. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගා නිම්න 34ක් තිබේ. (............)

08. නයිල් නිම්න ශිෂ්ටාචාරය ආසියාවේ බිහිවූ ප්‍රධාන මානව ශිෂ්ටාචාරයකි. (............)

09. පුමිතිරි අනුපාතය යනු පුරුෂයින් 100කට සිටින ස්ත්‍රීන් සංඛ්‍යාවයි. (............)

10. වනාන්තර විනාශ කිරීම ජල මූලාශ්‍ර විනාශවීමට හේතු වේ. (............)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. යුරෝපය හා ආසියාව වෙන් කෙරෙන මායිම් වලින් එකක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. යුරල් ගඟ 2. එරල් මුහුද 3. රතු මුහුද 4. හිමාලය කඳු වැටිය

12. ධ්‍රැව සහ තුන්ද්‍රා දේශගුණය පවතින ප්‍රදේශයකි,
    1. ජපන් දූපත් 2. සයිබීරියාව 3. තාර් කාන්තාරය 4. බංග්ලාදේශය

13. පාකිස්ථානයේ මුළු භූමියෙන් 25%ක් පමණ යොදාගෙන ඇත්තේ පහත සඳහන් කවර ආර්ථික කටයුත්තක් සඳහා ද?
    1. කෘෂිකර්මය 2. කර්මාන්ත 3. සේවා 4. වාරි මාර්ග

14. රටක දළ උපත් අනුපාතය හා දළ මරණ අනුපාතය අතර වෙනස,
    1. ශුද්ධ සංක්‍රමණයයි 2. ජන සංඛ්‍යා වර්ධනයයි
    3. ජන සංඛ්‍යාවේ ස්වාභාවික වර්ධනයයි 4. ජන සංයුතියයි

15. සීමාව ඉක්මවා පරිසරයට අපද්‍රව්‍ය එකතු කිරීම,
    1. පරිසර සංරක්ෂණයට බලපායි 2. පරිසර පරිහරණයට බලපායි
    3. පරිසර පැවැත්මට බලපායි 4. පරිසර සමතුලිතතාවයට බලපායි

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ''අ'' තීරුවේ දැක්වෙන තොරතුරු වලට අදාළ පිළිතුරු ''ආ'' තීරුවෙන් තෝරා ඊට හිමි අක්ෂරය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියා දක්වන්න.

| ''අ'' | | | ''ආ'' |
|---|---|---|---|
| 16. $18^{0}C$ ට වැඩි උෂ්ණත්වය | (.................) | A | මඩකලපුව |
| 17. නිවර්තන වර්ෂා දේශගුණය | (.................) | B | වියළි කලාපය |
| 18. වී වගාව | (.................) | C | හම්බන්තොට |
| 19. ළදරු මරණ අනුපාතය වැඩිම දිස්ත්‍රික්කය | (.................) | D | නිවර්තන කලාපය |
| 20. ආයු අපේක්ෂාව වැඩිම දිස්ත්‍රික්කය | (.................) | E | සුමාත්‍රා, ජාවා |

## II කොටස

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි ''අ'' ''ආ'' සහ ''ඉ'' යන කොටස් තුනටම පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයීම සඳහා වෙනම කඩදාසියක් භාවිත කරන්න.


01. (අ) i. සමෝච්ඡ රේඛා මත පදනම් ව ඇඳ ඇති පහත දැක්වෙන සිතියම් කොටසෙහි අංක 1 සිට 4 තෙක් ඇති භූ ලක්‍ෂණ වරහන් තුළින් තෝරා ලියන්න. (ලකුණු 04)

(ප්‍රධාන ගංගාව, උස්බිම, තැනිතලාව, අතු ගංගාව, නෙරුව, නිම්නය, සානුව)

ii. 1: 50,000 භූ ලක්‍ෂණ සිතියමක පෙන්නුම් කරන පහත සඳහන් සංස්කෘතික ලක්‍ෂණ සම්මත සංකේත හා වර්ණ වලින් ඇඳ දක්වන්න.


1. පළාත් මායිම
2. ප්‍රධාන මාර්ගය A ශ්‍රේණිය
3. පොලීසිය
4. වී වගාව

(ලකුණු 04)





(ආ) ආසියානු ප්‍රදේශය දැක්වෙන පහත සිතියමේ ලකුණු කර ඇති ස්ථාන අතරින් පහත සඳහන් ස්ථාන වලට හිමි ඉංග්‍රීසි අක්ෂර ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න. (ලකුණු 04)

1. අරාබි මුහුද
2. ගංගා නම් ගඟ
3. ටිබෙට් සානුව
4. තායිවානය



(ඉ) යාබදව ඇති ශ්‍රී ලංකා සිතියමේ ලකුණු කර ඇති ස්ථාන අතරින් පහත සඳහන් ස්ථාන වලට අදාළ ඉංග්‍රීසි අක්ෂර ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න. (ලකුණු 04)

1. කැලණි ගඟ
2. දෙවුන්දර තුඩුව
3. කෑගල්ල දිස්ත්‍රික්කය
4. කයිට්ස් දූපත




2. i. පහත සඳහන් ගංගා මුල්කර ගනිමින් ආසියාව තුළ බිහිවූ පැරණි මානව ශිෂ්ටාචාර සඳහන් කරන්න. (ලකුණු 03)

(a) ඉන්දු ගඟ -
(b) හොවැංහෝ ගඟ -
(c) යුප්‍රටීස්, ටයිග්‍රීස් ගඟ -


ii. (a) ආසියාවේ වැඩිම ජන සංඛ්‍යාවක් වෙසෙන රටවල් දෙක සඳහන් කරන්න.
(b) ආසියාවේ අඩුම ජන සංඛ්‍යාවක් වෙසෙන රටවල් දෙක සඳහන් කරන්න. (ලකුණු 04)

iii. ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

03. i. ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප තුන නම් කරන්න. (ලකුණු 03)

ii. යාබද සිතියමේ අංක 1 සිට 4 තෙක් ඇති වෙරළ භූ ලක්ෂණ නම් කරන්න. (ලකුණු 04)


iii. වෙරළබඩ භූ දර්ශනයේ ආර්ථික වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04)



04. i. ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා කලාප වර්ග කිරීම සඳහා යොදාගෙන ඇති දේශගුණික සාධක දෙක ලියන්න. (ලකුණු 02)

ii. යාබද සිතියමේ A, B හා C වලින් පෙන්නුම් කරන වෘක්ෂලතා කලාප නම් කරන්න. (ලකුණු 03)

iii. ඔබ කැමති එක් වෘක්ෂලතා කලාපයක් තෝරාගෙන පහත තේමා වලට අදාළව පිළිතුරු සපයන්න. (ලකුණු 06)




(a) වෘක්ෂලතා කලාපය ..........................................................

(b) ව්‍යාප්ත ප්‍රදේශ 1. ..........................................................

2. ..........................................................

(c) ප්‍රධාන ශාක 3. ..........................................................

4. ..........................................................

(d) වෘක්ෂලතා ලක්ෂණ 5. ..........................................................

6. ..........................................................

05. i. ශ්‍රී ලංකාවේ වැඩිම හා අඩුම ජන ඝනත්වයක් සහිත දිස්ත්‍රික්ක දෙක පිළිවෙලින් ලියන්න. (ලකුණු 02)

ii. වයස් සංයුතිය අනුව ජන සංඛ්‍යාව බෙදා දක්වන වයස් කාණ්ඩ තුන සඳහන් කරන්න. (ලකුණු 03)

iii. ප්‍රධාන ජනාවාස වර්ග තුන සඳහන් කර ඉන් එක් ජනාවාසයක ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

06. i. ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප පිහිටා ඇති ප්‍රදේශ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. සංවර්ධනය මැනීම සඳහා ලෝකයේ රටවල් යොදාගනු ලබන දර්ශක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. (a) තෙත් කලාපය හා වියළි කලාපය වෙන් කෙරෙන ගංගා දෙක සඳහන් කරන්න. (ලකුණු 02)

(b) තෙත් කලාපය තුළ සිදු කෙරෙන මානුෂ ක්‍රියාකාරකම් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

07. i. තිරසර සංවර්ධනය යනු කුමක් ද? (ලකුණු 02)

ii. පරිසර තුලිතතාව බිඳවැටීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල තුනක් ලියන්න. (ලකුණු 03)

iii. පරිසර තුලිතතාව බිඳ වැටීමට බලපාන මානව ක්‍රියාකාරකම් තුනක් සඳහන් කර ඉන් එකක් මගින් සිදුවන බලපෑම විස්තර කරන්න. (ලකුණු 06)